**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරණ විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරණ විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ගබඩා අත්තිකාරම් ගිණුම සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවලට ඇතුළත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුමක්ද, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමෙන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින නාවික හමුදාධිපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්යමණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලදී.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වනු ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| | | 2. කළමනාකරණ දුර්වලතා | 2.5 |
| | | 3. සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම. | 2.6 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවල දී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද, සම්පූර්ණයෙන්ම ද, අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද, ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.12 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | පොදු තැන්පත් ගිණුමේ අඩුපාඩු | 2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත්තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම/ ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2. 1 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව | ගබඩා අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් | 2.8 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකරගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.7 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන් දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ | මුදල් සම්බන්ධව කටයුතු කරන ලද නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම | 2.12 |

සේවකයන් මත අධිභාර පනවනු ලබයි. (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය)

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල එම වාර්තාව 2018 ඔක්තෝබර් 18 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම

#### 2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියළු ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් රු.මිලියන 142.39 ක සැපයීම් හා සේවා සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුව සපත්තු, හිස් වැසුම්, ශාරීරික අභ්‍යාස ඇඳුම් යනාදි නිල ඇඳුම් ප්‍රමාණය ඒකක 7,122 ක් මිලදී ගැනීම සඳහා සැලසුම් කලද සමාලෝචිත වර්ෂය තුළදී ඒකක ප්‍රමාණය 14,954 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා රු.මිලියන 4.37 ක නිල ඇඳුම් අවස්ථා 14 කදී මිලදීගෙන තිබුණි. තවද, වෙබ් බෙල්ට් (ඔලිව් ග්‍රීන්) අවශ්‍යතාවය ඒකක 527 ක් වූ නමුත් ඒකක 2,250 ක් මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 1.52 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය ප්‍රකාර ලංසු පරීක්ෂාවන් සිදුකළ දින සිට අදාල මාර්ගෝපදේශයේ සඳහන් කාල සීමාව තුළදී ගිවිසුම්වලට එළඹ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කළ යුතු වුවත්, රු.මිලියන 5 සිට රු.මිලියන 100 දක්වා වූ සැපයීම් සේවාවන් වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සති 16 සිට අවුරුදු 2 මාස 4 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(ඈ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරුවන්ගෙන් ලංසු සඳහා සුරක්ෂණයක් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 71 කදී රු.මිලියන 257 ක් වටිනා නිල ඇඳුම්, යන්ත්‍ර අමතර කොටස් මිලදී ගැනීමේදී ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ඉ) උක්ත කරුණට අමතරව, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ මිලදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක කොන්ත්‍රාත්කරුවන් විසින් භාණ්ඩවල පිරිවැයෙන් සියයට 10 කට නොඅඩු මුදලක පිලිගත හැකි ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත්, අවස්ථා 49 කදී රු.මිලියන 172 ක් වටිනා මිලදීගැනීම් සම්බන්ධයෙන් කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ඊ) නාවික හමුදාවේ නිලධාරීන් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීමේදී අඩුම මිල ඉදිරිපත් කරන ලද ආයතනය විසින් ලබාදුන් නියැදි, ලංසු ආරාධනා පත්‍රයේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූල බව ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය විසින් වාර්තා කර තිබුණි. එසේ වුවද, අවම මිල ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කර වෙනත් ආයතනයකට ලංසු ප්‍රදානය කර තිබීම හේතුවෙන් රු.1,040,400 ක වැඩිපුර වැයකර තිබුණි.

(උ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.ලක්ෂ 5 ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 178 කදී රු.මිලියන 407 ක් වටිනා නිල ඇඳුම්, යන්ත්‍ර හා යාත්‍රා අමතර කොටස් යනාදී මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඌ) ටී ෂර්ට්, සපත්තු, බොත්තම්, අත්පලඳනා යනාදි නිල ඇඳුම් හා උපාංග විෂයයන් මිලදී ගැනීම සඳහා පිළියෙල කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව ඇණවුම් 32 ක් මඟින් රු.34,528,903 වටිනා නිල ඇඳුම් විෂයයන් 54,916 ක් මිලදී ගෙන තිබුණි.

(එ) බෝට්ටු හා නෞකා අමතර කොටස් මිලදී ගැනීමේදී ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අමතර සහතික නොතිබුණු බව සඳහන් කර රු.3,023,828 ක්වූ අවම මිල ඉදිරිපත් කළ ලංසුව ප්‍රතික්ෂේප කර රු.4,988,211 ක මිල ඉදිරිපත් කර තිබුණු දෙවැනි අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. කෙසේ වෙතත්, ලංසු ආරාධනා පත්‍රයේ ගුණාත්මකභාවය තහවුරු කිරීමට අවශ්‍ය සහතික ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු බව දක්වා නොතිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

-----------------------------

### (අ) වත්කම් ලේඛනගත කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුලත් වත්කම්වල වටිනාකම රු.19,373,586,031 ක්වූ ශේෂය, ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වූ රු.42,782,100,263 ක්වූ ශේෂය සමඟ නොගැලපුණි. එබැවින් එම ශේෂයන්හි නිරවද්‍යතාවය පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය.

### (ආ) වාහන උපයෝජනය

------------------------

2009 ඔක්තෝබර් 21 දිනැති අංක 13/2008 (iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මසකට වැඩි කාලයක් වැටුප් සහිතව හෝ රහිතව විදේශගතව සිටින කාලය තුළ නිල රථ භාවිතයට හෝ රියදුරන්ගේ සේවය ලබාගැනීමට හෝ නිලධාරියකුට හිමිකම් නොමැත. සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අවස්ථා 25 කදී උක්ත චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරමින් නිලධාරීන් විදේශගතව සිටි අවස්ථාවලදී පොදු 268 ආකෘතිපත්වල අදාල නිලධාරියාගේ නම සඳහන් කරමින් නිලරථ භාවිතා කර තිබුණු බවත් ඒ වෙනුවෙන් රු.මිලියන 7.20 ක් වැයකර දරා තිබුණු බවත් නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

**(ඇ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

(i) 1971 වර්ෂයේ සිට අත්පත් කරගෙන තිබුණු රු.මිලියන 1,770 ක්වූ පැරණි නෞකා හා යාත්‍රා 140 ක් ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් යාත්‍රාංගනවල 2017 දෙසැම්බර් 31 දින වන විට අක්‍රියව පැවති අතර ඉන් යාත්‍රා 55ක් 2018 සැප්තැම්බර් 30 දින වන විට අළුත්වැඩියා කර තිබුණි. ඒ අනුව එදිනට නෞකා හා යාත්‍රා 85 ක් අක්‍රීයව පැවතුණි. මෙම නෞකා හා යාත්‍රා අළුත්වැඩියා කිරීමට හෝ එකතුව රු.මිලියන 922 ක අපහරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ii) 1995 සහ 1996 වර්ෂවල මිලදීගත් එහෙත් පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු රු.මිලියන 239 ක් වටිනා මැෂින් තුවක්කු 101 ක් නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි.

(iii) පිරිවැය රු. මිලියන 1.26 ක් වූ කැබ් රථයක් වර්ෂය 02 කට වැඩි කාලයක් අළුත්වැඩියා කටයුතු සඳහා උතුරු මැද නාවික පරිශ්‍රයේ රඳවා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් එම අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

-----------------------------------------------------------------

වෙනත් ආයතන හා පුද්ගලයින් සතු ගොඩනැගිලි 221 ක් හා පෞද්ගලික අංශයේ ඉඩම් හෙක්ටයාර් 454 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවති අතර ඒවායේ හිමිකම පවරා ගැනීමට හෝ ආපසු පවරාදීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් විධිමත් පරිදි පවරා නොගත් පුද්ගලික ඉඩම්වල ගොඩනැගිලි සංවර්ධනය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 927.87 ක් වැය කර තිබුණි.

**2.4 බැඳීම් හා බැරකම්**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 154.02 ක් හෙවත් ඇ.ඩො.මිලියන 9.9825 ක් වටිනාකමකින් යුතු බැඳීම්වලට එළඹ තිබුණු නමුත් විසර්ජන ගිණුමෙහි ඒ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සලසා ඇතිවිටකදී දෙපාර්තමේන්තුව විසින් වැඩ හෝ සේවා හෝ සැපයීමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවද එයට පටහැනිව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වැය විෂයන් 10 කට අදාලව 2017 වර්ෂය තුළදී රු.මිලියන 37.57 ක බැරකම්වලට බැඳී තිබුණි.

(ඇ) 223-1-2-1-2502 (12) වැය විෂය යටතේ ඇ.ඩො.මිලියන 133.10 ක් වටිනා නාවික මුර යාත්‍රා දෙකක් මිලදීගැනීම සඳහා 2013 මැයි 13 දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඇ.ඩො.මිලියන 3.3275 ක්වූ බැරකමට අදාල දේශීය මුදල් අගය ගණනය කර විසර්ජන ගිණුමේ බැරකම් යටතේ හෙළිදරව් කර

නොතිබුණි. මේ පිළිබඳව 2015, 2016 වර්ෂයේ විසර්ජන ගිණුම සඳහා වූ විගණන නිරීක්ෂණ මඟින්ද පෙන්වා දුන්නද ඒ පිළිබඳව සැලකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂයේදී විසර්ජන ගිණුම පිළියෙල කර තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) 2018 ජනවාරි සහ පෙබරවාරි මස ගෙවීම් වවුචර් පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී 2017 වර්ෂයට අදාලව එකතුව රු.මිලියන 149.67 ක් වූ වියදම් 2018 වර්ෂයේ ප්‍රතිපාදනවලින් වැය කර තිබුණද, එම වියදම්වල වටිනාකම 2017 වර්ෂයේ විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

(අ) 2013 මැයි 13 දින එළඹි ගිවිසුම ප්‍රකාරව ඉන්දියානු ණය ක්‍රමය යටතේ වූ මූල්‍ය ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා නාවික හමුදාවේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඉන්දියානු නාවික යාත්‍රාංගනයේදී නිෂ්පාදනය කර තිබුණු වටිනාකම ඩොලර් මිලියන 133 කට සමාන රු.මිලියන 19,950 ක් පමණ වටිනා නාවික යාත්‍රා 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබී තිබුණි. මෙම මුර යාත්‍රාවල කුඩා ප්‍රමාණයේ හෙලිකොප්ටර් 02 ගාල් කිරීම සඳහා ඉඩ ප්‍රමාණයක් වෙන්කර තිබෙන නමුත්, ඊට සරිලන කුඩා ප්‍රමාණයේ හෙලිකොප්ටර් නිරීක්ෂණ යානා මිලදී ගෙන නොතිබුණු බැවින් නෞකාවේ උපරිම කාර්යක්ෂමතාවයක් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) බටහිර නාවික විධානයේ කොමදෝරු අධිකාරී තටාකාංගනය විසින් අළුත්වැඩියාවන් සඳහා බාහිර ආයතන වෙත ලබාදී 2017 දෙසැම්බර් 31 වන දිනට මාස 08 සිට මාස 22 දක්වා කාලයක් ගතවී තිබුණද රු. මිලියන 1.76 ක්වූ යාත්‍රා කොටස් හා මැණුම් උපකරණ අළුත්වැඩියාවන් නිමකර ආපසු ලබාගෙන නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම්වර්ගය | ශුද්ධප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරියශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| **2013** | පුනරාවර්තන | 38,556.03 | 36,692.88 | 1,863.15 | 4.83 |
| | මූලධන | 4,778.50 | 3,248.78 | 1,529.73 | 32.01 |
| | **එකතුව** | **43,334.53** | **39,941.66** | **3,392.88** | **7.83** |
| **2014** | පුනරාවර්තන | 48,432.62 | 48,343.49 | 89.14 | 0.18 |
| | මූලධන | 5,886.62 | 5,826.64 | 59.97 | 1.02 |
| | **එකතුව** | **54,319.24** | **54,170.13** | **149.11** | **0.27** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2015** | පුනරාවර්තන | 48,187.80 | 48,025.63 | 162.17 | 0.34 |
| | මූලධන | 9,854.58 | 9,016.80 | 837.78 | 8.50 |
| | **එකතුව** | **58,042.38** | **57,042.43** | **999.95** | **1.72** |
| **2016** | පුනරාවර්තන | 48,730.50 | 46,874.21 | 1,856.29 | 3.81 |
| | මූලධන | 13,194.37 | 9,860.41 | 3,333.97 | 25.27 |
| | **එකතුව** | **61,924.87** | **56,734.62** | **5,190.26** | **8.38** |
| **2017** | පුනරාවර්තන | 48,570.86 | 47,709.02 | 861.84 | 1.77 |
| | මූලධන | 9,142.56 | 7,332.51 | 1,810.04 | 19.80 |
| | **එකතුව** | **57,713.42** | **55,041.53** | **2,671.88** | **4.63** |

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

නිසි ලෙස කරුණු සොයා බැලීමකින් පසුව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පමණක් ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් හෝ කළමනාකරණය විසින් නියමිත කාලවකවානුව තුළදී නිශ්චිත කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 11 සිට සියයට 80 දක්වා ඉතිරිවී තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 550.00 | 532.90 | 500.00 | 510.28 | 910.00 | 323.54 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර වසරකට වඩා වැඩි කාලයක් තුළ අය නොවී පවතින ණය ශේෂවල එකතුව රු.මිලියන 24.68 ක්වූ අතර ඉන් රු.මිලියන 23.10 ක් වසර 05 කට වඩා වැඩි කාලයක් තුළ අය නොවී පැවතුණි. එය අය නොවී පවතින ණය ප්‍රමාණයෙන් සියයට 93.6 ක නියෝජනයක් විය.

## 2.8 ගබඩා අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22302 යටතේ ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 575.00 | 513.19 | 595.00 | 646.04 | 380.00 | 60.79 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය ප්‍රකාරව 2017 මූලික ආදායම් ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වුවත්, රජයේ ආදායම් ඇස්තමේන්තුව අනුව වටිනාකම රු.මිලියන 100 කි. ඒ අනුව රු.මිලියන 5 ක වෙනසක් පෙන්නුම් කෙරුණි.

(ආ) ගබඩා අත්තිකාරම් ගිණුමේ ආදායම් ප්‍රකාශයට අනුව වර්ෂයේ ශුද්ධ ආදායම රු.මිලියන 112.53 ක් වුවත්, සිහිවටන ආදායම් ප්‍රකාශය අනුව එදිනට ශුද්ධ ආදායම රු.මිලියන 118.58 ක් වශයෙන් දක්වා තිබුණු අතර ඒ අනුව රු.මිලියන 6.05 ක වෙනසක් පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 136 යටතේ වෝටර් ජෙල් කි.ග්‍රෑ.126,000 ක් මිලදී ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් කි.ග්‍රෑ.135,000 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව අනුමත ප්‍රමාණය ඉක්මවා කි.ග්‍රෑ.9,000 ක් වැඩියෙන් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 4.18 ක මුදලක් අමතරව ගෙවා තිබුණි.

## 2.9 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජුලි 14 දිනැති අංක 3/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්ය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 36 කට අදාලව ලබා දී තිබුණු එකතුව රු.මිලියන 15.84 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිමයන් කාර්ය නිමවී මාස 01 ක සිට මාස 10 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(ආ) මු.රෙ.371(5) ප්‍රකාරව නිකුත් කරන ලද අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරිවන ශේෂය එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත්, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අවස්ථා 07 කදී ලබා දී තිබුණු රු.321,746 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2017 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබුණි.

## 2.10 පොදු තැන්පත් ගිණුම

ශ්‍රී ලංකා නාවික හමුදාවේ පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 271.56 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ ආපසු ගෙවීම සිදු කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 63.15 ක්වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම රු.මිලියන 13.17 ක රජයේ ආයතනයන්ගෙන් ලැබී තිබුණු අතර එම මුදල් අදාල කාර්යයන් සඳහා භාවිතා නොකර වර්ෂ 1½ සිට වර්ෂ 5 දක්වා කාලපරිච්ඡේදයක් පුරා ශ්‍රී ලංකා නාවික හමුදාවේ තැන්පත් ගිණුමේ රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.11 මානව සම්පත් කළමණාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**නිල ඇඳුම් කාර්ය මණ්ඩලය**

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | නිත්‍ය | 43,923 | 39,340 | 4,583 | - |
| (ii) | ස්වේච්ඡා | 5,500 | 4,256 | 1,244 | - |
| (iii) | විශේෂ ක්‍රමය | 2,000 | 7,241 | | 5,241 |
| (iv) | නිත්‍ය නාවික උප සේවය | - | 257 | | - |
| (v) | ස්වේච්ඡා නාවික උප සේවය | - | 119 | | - |
| | එකතුව | 51,423 | 51,273 | 5,827 | 5,241 |

**සිවිල් කාර්ය මණ්ඩලය**

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 08 | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 03 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 132 | 68 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,768 | 1,502 | 266 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 195 | 195 | - |
| | එකතුව | 2,113 | 1,776 | 337 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් 97 දෙනෙකු හා සෙසු නිලයන් 3748 දෙනෙකු ප්‍රමාණයක් පිටස්තර ආයතන සඳහා මුදා හැර තිබුණි.

(ආ) 2009 වර්ෂයේ යුධ ජයග්‍රහනයෙන් පසුව නාවික හමුදා නිලධාරීන්/ නාවිකයින්ගේ ඉදිරි ශ්‍රම උපයෝජනයන් සිදුකරන ආකාරය පිළිබඳ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය වේ.

(ඇ) නාවික නිවාඩු නිකේතන හා උත්සව ශාලා පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නාවික විධාන 06 ක නිවාඩු නිකේතන 07 ක් හා උත්සව ශාලා 05 ක නාවික සුභ සාධනය සඳහා පවත්වා ගෙන යනු ලබන අතර මෙම නිවාඩු නිකේතන 2016 ජනවාරි මස සිට ශ්‍රී ලංකා නාවික නියෝග අනුව ලාභ ලැබීමේ අරමුණින් තොරව පවත්වා ගෙන යනු ලබයි. රජයේ නොවන අරමුදල් වශයෙන් සලකා මේවායේ කටයුතු පවත්වා ගෙන යනු ලබන අතර ලැබෙන ආදායම් රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට බැර නොකරන බව නිරීක්ෂණය විය.

2017 දෙසැම්බර් 31 දිනට මෙම නිවාඩු නිකේතන හා උත්සව ශාලා සඳහා නිලධාරීන් 27 දෙනෙකු හා සෙසුනිලයන් 448 දෙනෙකු අනුයුක්ත කර තිබුණු බව නිරීක්ෂණය විය. අදාල නිවාඩු නිකේතන හා උත්සව ශාලා මෙහෙයුම් හා නඩත්තු කටයුතු සහ උපයෝජනය කළ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා සඳහා ඒකාබද්ධ අරමුදල යටතේ වූ ප්‍රතිපාදන මඟින් මුදල් වැය කර තිබුණු නමුත් ඒ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කිරීමට හෝ අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.12 රජයේ මුදල් භාරව සිටින නිලධාරීන් විසින් ඇප නොතැබීම

-------------------------------------------------------------------

මුදල් රෙගුලාසි 880(ii) අනුව කවර හෝ නිලධාරියෙකු එක් දිනකදී තමන්ගේ පෞද්ගලික භාරයේ පවතින මුදල් ප්‍රමාණය එකී නිලධාරියාගේ තෙමසක වැටුප ඉක්මවන්නේ නම් එකී නිලධාරියා ඇප තැබීම කළ යුතු අතර, තෙමසක වැටුපට වැඩි නොවන බවට අමාත්‍යාංශ ලේකම්වරයා සෑහීමකට පත්වන්නේ නම් පමණක් ඔහු විසින් එකී නිලධාරියා ඇප තැබීමෙන් නිදහස් කළ හැකි අතර, අනෙකුත් සියළුම මුදල් භාරව සිටින නිලධාරීන් ඇප තැබිය යුතුය. එසේ නොමැතිව අවස්ථා 54 කදී රු.මිලියන 35.28 ක මුදල් ප්‍රමාණයක් නිලධාරීන් 10 ක් වෙත ලබා දී තිබුණි.